# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120
ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635
දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 228 /2024
ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024
දිනය / திகதி / Date — 08/02/2024 පැය 1745

## මාධ්‍ය නිවේදනය

**මල්වතුහිරිපිටිය පොලිස් වසමේදී හිමිනමක් වෙඩිතබා ඝාතනය කිරීමේ සිද්ධියේ ප්‍රධාන සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය.**

2024.01.23 වන දින රාත්‍රී කාලයේ මල්වතුහිරිපිටිය පොලිස් වසමේ විහාරස්ථානයක වැඩ විසූ හිමිනමකට වෙඩි තබා ඝාතනය කිරීමේ අපරාධය සම්බන්ධයෙන් බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය මඟින් විමර්ශන ආරම්භ කර තිබුණි.

ඒ අනුව 2024.02.07 වන දින රාත්‍රී කාලයේ අතුරුගිරිය පොලිස් වසමේදී මෙම අපරාධයේ ප්‍රධාන සැකකරුවෙකු විදේශ රටක නිෂ්පාදිත ජීව අත්බෝම්බයක්, අපරාධ සිදු කිරීම සඳහා යොදා ගත් බවට සැකකරන ටී 56 වර්ගයේ ගිනි අවියක්, පිස්තෝල අවියක් හා අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 මිලිග්‍රෑම් 300 ක්, පතරොම් ගැබ් 03 ක්, ජීව පතරොම් 19 ක්, ව්‍යාජ අංක තහඩු සහිත යතුරුපැදියක්, ගිනි තබා විනාශ කරන ලද කාර් රථයේ රිමෝට් ස්විච් යතුර, ජංගම දුරකථනයක් ඇතුළු දේපල සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වූ මුල්ලේගම, හෝමාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරු දැනට විදේශගතව සිටින සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයන් දෙදෙනෙකුගේ මෙහෙයවීමෙන් මෙරට සිදු කරනු ලබන මත්ද්‍රව්‍ය ජාවාරම් හා අපරාධ වලට සෘජුවම සම්බන්ධ බවට දැනට සිදු කරන ලද විමර්ශන වලදී අනාවරණය වී ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**